# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2252/49 - 2021 නොවැම්බර් මස 05 වැනි සිකුරාදා - 2021.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ රිදීගම ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතුකොට ගෙන රිදීගම ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ රිදීගම ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ අප්පුකුට්ටි දේවයලෑ මනෝජා බිෂාන්ති මාලවිකා කරුණාදස අයත් වන්නා වූ ලිබරල් පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම රිදීගම ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා බොරළුවේ ගෙදර දේවගේ සුජීවා නිල්මිණි ධම්දාස නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

රිදීගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී, රත්නායක මුදියන්සේලාගේ හරේන්ද්‍ර බංඩාර රත්නායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් බොරළුවේ ගෙදර දේවගේ සුජීවා නිල්මිණි ධම්දාස, රිදීගම ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

රත්නායක මුදියන්සේලාගේ හරේන්ද්‍ර බංඩාර රත්නායක,
තේරීම්භාර නිලධාරී,
රිදීගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 02 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

1A - G 35282 — 30 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ බියගම ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන බියගම ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ බියගම ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ සේගු මදර් සෙයියදු හසන් අයත් වන්නා වූ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම බියගම ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා මොහොමඩ් නිසාම් මොහොමඩ් ඉර්ෂාද් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

බියගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, කරුණාසිංහ ජයරත්නගේ සම්පත් මාධව වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් මොහොමඩ් නිසාම් මොහොමඩ් ඉර්ෂාද්, බියගම ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**කේ. ජේ. එස්. මාධව,**
තේරීම්භාර නිලධාරී,
බියගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 03 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.